# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2003 අංක 33 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝම්බර් මස 22 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදි.

---

2003 ඔක්තෝම්බර් මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 4.25 යි.** **තැපැල් ගාස්තුව : රු. 4.50 යි.**

# 2003 අංක 33 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝබර් මස 22 වන දින ]

එල් . ඩී .-ඕ. 37/2002.

**1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**ලුහුඩු නාමය.**

1. මේ පනත 2003 අංක 33 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1996 අංක 28 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) ඒ වගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :-

''(අඅ) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ලේකම්වරයා පැමිණ නොසිටි විට අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා,'';

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ ''සාමාජිකයන් නව දෙනෙකු'' යන වචන වෙනුවට ''සාමාජිකයන් දස දෙනකු''යන වචන ආදේශ කිරීමෙන්.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ ''සභාවේ විසින් එහි යම් සාමාජිකයකු වෙත'' යන වචන වෙනුවට ''අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු පැමිණ නොසිටි විට අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා වෙත''යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

H 018090 -4,500 (2003/05)

# 2003 අංක 33 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත

"(3) ප්‍රසිද්ධ ගොඩනැගිලිවලට,ප්‍රසිද්ධ ස්ථානවලට සහ පොදු සේවාව වලට ආබාධ සහිත තැනැත්තන්ට ප්‍රවිෂ්ය වීමට හැකි වන පරිදි පහසුකම් සැලසීමේ ක්‍රමය සහ ආකාරය නියම කරනු ලැබිය හැකි විය යුතු ය."

**අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.**

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

**පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870 කි. (විදේශීය) රු.1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.**